# සිංහල නාම විභක්ති ප්‍රත්‍යය හා විභක්ති සූචක නිපාත පිළිබඳ අධ්‍යයනයක් (ක්‍රි.ව. 10වන සියවසේ සිට ක්‍රි.ව. 12වන සියවස තෙක් සෙල්ලිපි හා ගද්‍ය සාහිත්‍ය ඇසුරෙනි)

RARE

RECEIVED
20 MAR 2017
Faculty of Graduate Studies
University of Kelaniya

කැලණිය විශ්වවිද්‍යාලයේ දර්ශනපති උපාධි පරීක්ෂණය සඳහා

ඉදිරිපත් කෙරෙන ස්වාධීන පර්යේෂණ නිබන්ධයයි.

ඊ.එම්. නීල් පුෂ්පකුමාර

FGS/04/MPhil/08/2013/01

ප්‍රවේශ අංකය: 1319
වර්ග අංකය:

සිංහල අධ්‍යයන අංශය

මානවශාස්ත්‍ර පීඨය

කැලණිය විශ්වවිද්‍යාලය

කැලණිය

2016 ජූලි

# හැඳින්වීම

සිංහල නාම විභක්ති ප්‍රත්‍යය හා විභක්ති සූචක නිපාත පිළිබඳ අධ්‍යයනයක් (ක්‍රි.ව. 10වන සියවසේ සිට ක්‍රි.ව. 12වන සියවස තෙක් සෙල්ලිපි හා ගද්‍ය සාහිත්‍ය ඇසුරෙනි) මැයෙන් කෙරෙන මේ ස්වාධීන පර්යේෂණ නිබන්ධය කැලණිය විශ්වවිද්‍යාලයේ දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන්නකි. මෙයින් අධ්‍යයනය කෙරෙන්නේ සිංහල නාම විභක්ති ප්‍රත්‍යය හා විභක්ති සූචක නිපාත පිළිබඳ ව ය. නාම විභක්ති හා ක්‍රියා විභක්ති වශයෙන් සිංහල භාෂාවේ විභක්ති දෙවැදෑරුම් වෙයි. ඒ අතරින් නාම විභක්තිවලට පමණක් මෙම අධ්‍යයනය සීමා වෙයි. විභක්ති, සිංහල භාෂාවේ ව්‍යාකරණ පිළිබඳ විමසීමේ දී ප්‍රධාන වශයෙන් අවධානයට යොමු වන වියරණාංගයකි. විශේෂයෙන් නාම විභක්ති ප්‍රත්‍යය හා විභක්ති සූචක නිපාත සම්බන්ධයෙන් අතීතයේ සිට ම ඒකමතිකත්ත්වයක් නොවූ බව පෙනෙයි. දැනට විද්‍යමාන පැරණි ම සිංහල ව්‍යාකරණ ග්‍රන්ථය වන **සිදත්සඟරාව** රචනා වන අවධිය වන විට ද ඒ තත්ත්වය එසේ ම පැවති බව තත් කෘතියෙන් ම පැහැදිලි වෙයි. වර්තමානයේ ද සිංහල නාම විභක්ති ප්‍රත්‍යය හා විභක්ති සූචක නිපාත පිළිබඳ පොදු සම්මුතියක් දැකිය නොහැකි ය. එහෙයින් ක්‍රි.ව. 10වන සියවසේ සිට ක්‍රි.ව. 12වන සියවස තෙක් සෙල්ලිපි හා ගද්‍ය සාහිත්‍ය මත පදනම් ව සිංහල නාම විභක්ති ප්‍රත්‍යය හා විභක්ති සූචක නිපාත පිළිබඳ මෙම නිබන්ධයෙන් සාකච්ඡා කෙරෙයි. ඒ පිළිබඳ පරිච්ඡේද හතරක් යටතේ කරුණු සාකච්ඡා වෙයි. 'ප්‍රවේශය, සාහිත්‍ය අධ්‍යයනය හා මූලාශ්‍රය හැඳින්වීම, සිංහල නාම විභක්ති ප්‍රත්‍යය හා විභක්ති සූචක නිපාතවල ආරම්භය හා විකාසනය - (ක්‍රි.පූ. 03වන සියවසේ සිට ක්‍රි.ව. 10වන සියවස තෙක්), සිංහල නාම විභක්ති ප්‍රත්‍යය හා විභක්ති සූචක නිපාත (11-12 සියවස්)' යන මාතෘකා අනුව පිළිවෙළින් එම පරිච්ඡේද බෙදා දැක්වෙයි.

'ප්‍රවේශය' නමැති පළමු පරිච්ඡේදයෙන් විභක්ති, ප්‍රත්‍යය, විභක්ති ප්‍රත්‍යය නිර්ණය කිරීම, විභක්ති සූචක නිපාත, විභක්ති, විභක්ති ප්‍රත්‍යය සහ විභක්ති සූචක නිපාත වර්ගීකරණය සහ වෙනත් යෙදුම් යන මූලික ශීර්ෂ කිහිපයක් යටතේ කරුණු සාකච්ඡා කෙරෙයි. මෙහි දී මාතෘකාව පිළිබඳ ප්‍රවේශයත්, විභක්ති, ප්‍රත්‍යය ආදි කොටස් පිළිබඳ නිර්වචනාශ්‍රයෙන් හැඳින්වීමත්, එම නිර්වචන, වර්ගීකරණ ආදියෙන් මෙම නිබන්ධයෙහි ලා යොදා ගැනෙන අර්ථ දැක්වීම්, විභේදන ආදියත්, ඒ සඳහා බලපෑ සාධකත්, මේ නිබන්ධයේ යෙදෙන මූලික යෙදුම් පිළිබඳවත් සාකච්ඡාවට ලක් වෙයි. තව ද, මෙම අධ්‍යයනයෙහි ලා යොදා ගැනෙන මාතෘකාවේ කාලසීමාව, ඒ සඳහා බලපෑ කරුණු සහ යුග බෙදීම් සම්බන්ධයෙන් ද පළමු පරිච්ඡේදයේ දී විමසෙයි.

දෙවන පරිච්ඡේදයෙන් 'සාහිත්‍ය අධ්‍යයනය හා මූලාශ්‍රය හැඳින්වීම' කරනු ලබයි. උක්ත මාතෘකාවට අදාළ ව විවිධ උගතුන් විසින් මෙතෙක් සිදු කරන ලද පර්යේෂණ හා එමගින් සාකච්ඡා කෙරෙන කරුණු මේ යටතේ විමසීමට ලක් වෙයි. මූලාශ්‍රය හැඳින්වීම යටතේ ක්‍රි.ව. 10වන සියවසේ සිට ක්‍රි.ව. 12වන සියවස තෙක් උභය සීමාවන් ම ඇතුළත් වන පරිදි සෙල්ලිපි සහ ගද්‍ය ග්‍රන්ථ පිළිබඳ සඳහන් වෙයි. මෙම කාලයට අදාළ විභක්ති ප්‍රත්‍යය හා විභක්ති සූචක නිපාත පිළිබඳ කෙරෙන අධ්‍යයනයේ දී බෙහෙවින් වැදගත් වන කරුණ වන්නේ අදාළ මූලාශ්‍රය අයත් කාලය නිශ්චය කර ගැනීමයි. සෙල්ලිපිවල කාල

නිර්ණය කර ගැනීම ගද්‍ය සාහිත්‍ය කෘතිවල කාල නිර්ණය කිරීමට වඩා පහසු හෙයින් මෙහි දී ඒ ඒ සෙල්ලිපිය පිළිබඳ වෙන වෙන ම සාකච්ඡා නොකෙරෙන අතර කාල නිර්ණය පිළිබඳ වැඩි අවධානයෙන් ගද්‍ය කෘති පිළිබඳ හැඳින්වෙයි. මූලාශ්‍රය අධ්‍යයන ගැටලු යටතේ ඒ ඒ සංස්කාරකවරයා විසින් අනුගමනය කෙරුණු පද බෙදීම්, අක්ෂර වින්‍යාස පිළිබඳ නියමයන් හා පැරණි වියරණ හේතුවෙන් භාෂාවේ දැකිය හැකි විශේෂ ලක්ෂණ, ව්‍යංජන හා සංයෝග වූ ඒ, ඕ ස්වර දීර්ඝ වශයෙන් ලියා නොදැක්වීම වැනි කරුණු හා එම ගැටලු නිරාකරණය කර ගැනීමෙහි ලා අනුගමනය කරන ලද ක්‍රමවේදය දැක්වෙයි.

තෙවන පරිච්ඡේදය වෙන් වන්නේ 'සිංහල නාම විභක්ති ප්‍රත්‍යය හා විභක්ති සූචක නිපාතවල ආරම්භය හා විකාසනය (ක්‍රි.පූ. 03වන සියවසේ සිට ක්‍රි.ව. 10වන සියවස තෙක්)' පිළිබඳ විමසීමටයි. ක්‍රි.පූ. 03වන සියවසේ සිට ක්‍රි.ව. 10වන සියවස තෙක් සිංහල භාෂාවේ පැවති විභක්ති ප්‍රත්‍යය හා විභක්ති සූචක නිපාතවල ප්‍රභවය හා විකාසනය, ඒ සඳහා සංස්කෘත, පාලි හා දෙමළ වැනි භාෂාවලින් ලද ආභාසය මේ පරිච්ඡේදයේ දී සෙල්ලිපි සහ ගද්‍ය සාහිත්‍ය ඇසුරු කරමින් නිදර්ශන සහිත ව සාකච්ඡාවට බඳුන් වෙයි.

'සිංහල නාම විභක්ති ප්‍රත්‍යය හා විභක්ති සූචක නිපාත (11-12 සියවස්)' නම් වූ සිවුවන පරිච්ඡේදයේ ක්‍රි.ව. 11-12 සියවස්වල සිංහල භාෂාවේ විද්‍යමාන නාම විභක්ති ප්‍රත්‍යය හා විභක්ති සූචක නිපාත පිළිබඳ ව විමසුමට ලක් කෙරේ. එම අවධියේ නාම විභක්ති ප්‍රත්‍යය හා විභක්ති සූචක නිපාත යෙදුණු ආකාරය, පරිණාමය වූ ආකාරය ද මෙමඟින් අධ්‍යයනය කරනු ලැබෙයි.

අවසාන වශයෙන් අදාළ පරිච්ඡේදවල අන්තර්ගත කරුණු සමාලෝචනය කෙරෙයි. මූලාශ්‍රය දැක්වීමේ විධික්‍රමය වශයෙන් පිටු අග සටහන් ක්‍රමය හෙවත් චිකාගෝ ශෛලිය (Chicago Style) භාවිත කරන ලද අතර ඒ සඳහා උපදෙස් සඳගෝමී කෝපරහේවාගේ **ශාස්ත්‍රීය ලේඛනයක මූලාශ්‍රය දැක්වීමේ විධික්‍රම** නම් කෘතියෙනි.